**ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

#### 2.1.1 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා

2015 ජුනි 22 දිනැති 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකතනය සහ ඇස්තමේන්තු සකස් කිරීම විධිමත් පරිදි සිදු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | | **ආදායම් සංකේතාංකය 20:02:03:00 - ලාභ** | | |
| | (i) | 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම රු.41,669,457,000 ක් වූ අතර තත්‍ය ආදායම රු.60,496,772,520 ක් වී තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 145 ක් හෙවත් සියයට 45 ක වැඩිවීමකි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | ආදායම් රැස් කර ගැනීමට තිබෙන ආයතන පිළිබඳව නිවැරදිව පුරෝකථනය කර වඩාත් නිවැරදිව ආදායම් ඇස්තමේන්තු කළ යුතු වීම. |
| | (ii) | රාජ්‍ය ව්‍යවසායන් 10ක ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීම සියයට 3 ත් 88 ත් අතර පරාසයක පැවතුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහාත්, අයවැය පරතරය කෙතරම් ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස් කර ගැනීමට අදාළ වාර්තා තබා ගැනීම විධිමත් කළ යුතු වීම. |
| | (iii) | රාජ්‍ය ව්‍යවසායන් 08 කට අදාළව ලාභ ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණත්, එම ව්‍යවසායන්ගෙන් රු.මිලියන 6,396 ක ලාභ ආදායමක් ලැබී තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iv) | රාජ්‍ය ව්‍යවසායන් 12 කින් ඇස්තමේන්තු කරන ලද ලාභ ආදායමට වඩා වැඩියෙන් සියයට 25 ක සිට 300 ක දක්වා පරාසය ලාභ ප්‍රමාණයකින් ආදායමට දායක වී තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | -එම- |
| (v) | ආදායම් සංකේත 20.02.03.00 - (ලාභ) යටතට දායක විය යුතු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් වන ආයතන එනම්, සංස්ථා 38 ක් සහ ව්‍යවස්ථාපිත ආයතන 46 ක් පැවතිය ද, 2023 වර්ෂයේ ලාභ යටතට දායකය වන ආදායම් ඇස්තමේන්තුව සැකසීමේදී ආයතන 34 ක් එනම්, මුළු ප්‍රමාණයෙන් සියයට 40 ක් පමණක් ඇතුලත් කර තිබුණි. ඒ අනුව, රාජ්‍ය ව්‍යවසායන්ගෙන් සියයට 60 ක් ලාභ ආදායමට කිසිඳු දායකත්වයක් ලබා ගත නොහැකි ආයතන ලෙස ඇස්තමේන්තු සකස් කර තිබුණි. | ආදායම් ඇස්තමේන්තුව සකස් කිරීමේදී ලාභ ලැබෙන ආයතන සැළකිල්ලට ගැනීම සිදු කළ බව දන්වා සිටින අතර, එසේ ඇස්තමේන්තුව තුළ ඇතුළත් කරන ලද ආයතන වලද වර්ෂය තුළ සත්‍ය මූල්‍ය ක්‍රියාකාරීත්වය පදනම් කර ගෙන විචලතාවයන් සිදුවීමේ සම්භාවිතාවයක් පවතින බැවින්, ඇස්තමේන්තුගත කළ පරිදිම ලාභාංශ ආදායම් ලබා ගත නොහැකි වී ඇත. | -එම- |
| (ආ) | **ආදායම් සංකේතාංකය 20:02:04:00 - ලාභාංශ ආදායම** | | |
| (i) | 2023 වර්ෂයේ ලාභාංශ ආදායම සඳහා ඇස්තමේන්තුගත ආදායම රු.8,733,000,000 ක් වූ අතර තත්‍ය ආදායම රු.15,204,348,243 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රු.6,471,348,243 ක් රැස්කරගෙන තිබුණි. ඒ අනුව, එය ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 74 ක වැඩි වීමකි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහාත්, අයවැය පරතරය කෙතරම් ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස් කර ගැනීමට අදාළ වාර්තා තබා ගැනිම විධිමත් කළ යුතු වීම. |

<table>
<tr>
<td>(ii)</td>
<td>2022 වර්ෂයට අදාළව ලාභයෙන් රාජ්‍ය ව්‍යවසායන් 03 කින් රු.මිලියන 134 ක ලාභාංශ ආදායමක් සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු ලෙස ඇස්තමේන්තු කර තිබුණද එම ආයතනවලින් සමාලෝචිත වර්ෂය තුළදී ලාභාංශ ආදායමට කිසිදු දායකත්වයක් ලබාදී නොතිබුණි.</td>
<td>පහත ආයතන මහා භාණ්ඩාගාරයේ ආයෝජන සතු වෙනත් සමාගම් වන අතර මූල්‍ය වර්ෂය 2024.03.31 දිනෙන් අවසන් වේ. එම ආයතන අතුරු ලාභාංශ ප්‍රකාශයට පත්කොට ඒවා ඒකාබද්ධ අරමුදල වෙත ප්‍රේෂණය කර ඇත. විස්තර පහත පරිදි වේ.
<table>
<tr><th>ආයතනය</th><th>ලාභාංශ (රු.)</th><th>ප්‍රේෂණය කළ දිනය</th></tr>
<tr><td>ජාතික සංවර්ධන බැංකුව</td><td>1,809,329</td><td>2024.04.19</td></tr>
<tr><td>කොමර්ෂල් බැංකුව</td><td>159,375</td><td>2024.04.08</td></tr>
<tr><td>De La Rue Lanka (Pvt) Ltd</td><td>1,324,040,000</td><td>2024.01.29</td></tr>
</table>
</td>
<td>-එම-</td>
</tr>
<tr>
<td>(iii)</td>
<td>රාජ්‍ය ව්‍යවසායන් 04 ක ලාභාංශ ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව, තත්‍ය ආදායමේ අඩුවීම සියයට 47 ත් 92 ත් අතර පරාසයක පැවතුණි.</td>
<td>ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ මහජන බැංකුව<br><br>2023 පෙබරවාරි 02 දිනැතිව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අංක 01, 2023 ලෙස බැංකු පනතට අදාලව නිකුත් කර ඇති මහපෙන්වීම අනුව 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඒවා විගණනය කිරීම අවසාන වන තෙක් 2023 වර්ෂය සඳහා ලාභ හෝ ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමෙන් වැළකී සිටින ලෙසට උපදෙස් නිකුත් කොට ඇත.<br><br>ශ්‍රී ලංකා ටෙලිකොම්හි කොටසක ඉපයීම අඩුවීම මත සමාගම විසින් ප්‍රකාශිත කොටසක් සඳහා වූ ලාභාංශ ප්‍රමාණය අඩු වී තිබේ. ඒ අනුව ලාභාංශ ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩු වී ඇත.</td>
<td>-එම-</td>
</tr>
<tr>
<td>(iv)</td>
<td>රාජ්‍ය ව්‍යවසායන් 13 කින් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ලාභාංශ ආදායම ඉක්මවා සියයට 33ක සිට සියයට 2,500 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභාංශ ආදායමට දායක වී තිබුණි.</td>
<td>විගණන නිරීක්ෂණය හා එකඟ වේ.</td>
<td>-එම-</td>
</tr>
</table>

| | | | |
|---|---|---|---|
| (v) | ඇස්තමේන්තු ගත ලාභාංශ ආදායමට ඇතුලත් නොකරන ලද රාජ්‍ය ව්‍යවසායන් 4 ක්, සමාලෝචිත වර්ෂය තුලදී ලාභාංශ ආදායමට රු.මිලියන 7,131.2 කින් දායක වී තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | -එම- |
| (ඇ) | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන රාජ්‍ය සමාගම් 50ක් තිබුණද, ක්‍රමෝපායිකව වැදගත් වන රාජ්‍ය ව්‍යවසායන් යටතට ඇතුලත් කර තිබුණේ රාජ්‍ය සමාගම් 16 ක් පමණක් වු අතර අනෙක් රාජ්‍ය සමාගම් සම්බන්ධයෙන් වන අධීක්ෂණය පහල මට්ටමක පවතින බව නිරික්ෂණය විය. | ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට කැපී පෙනෙන දායකත්වයක් ලබාදෙන හා උපායමාර්ගික වශයෙන් වැදගත්කමක් උසුලන රාජ්‍ය ව්‍යවසායන් පමණක් ක්‍රමෝපායිකව වැදගත් වන රාජ්‍ය ව්‍යවසායන් යටතට ඇතුළත් කර ඇති බව සඳහන් කරමි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත්ව ඇති සියළුම රාජ්‍ය සමාගම් සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු කළ යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සැසඳීමේදී වැය විෂයන් 14 කට අදාළව විචලතාවය සියයට 40 ක අඩුවීමේ සිට සියයට 326 ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස් ව තිබුණි. | පහත සඳහන් කරුණු හේතු වී ඇත.<br>• අයවැය චක්‍රලේඛ අංක 02/2023 අනුව වියදම් පාලනය සිදු කිරීම.<br>• රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 අනුව කාර්ය මණ්ඩලයේ නිලධාරින් වැටුප් රහිත දේශීය හා විදේශීය නිවාඩු ලබා ගැනීම.<br>• අධිවේගී මාර්ග ප්‍රවේශ ගාස්තු ඉහළ යාම සහ නිලධාරීන් වෙත විදේශ අධ්‍යයන චාරිකා හා පුහුණුවීම් අවස්ථා ලද අතර, ඇස්තමේන්තු සකස් කරන අවස්ථාව වන විට පැවති විදේශ විනිමය හුවමාරු අගයට වඩා වියදම් දරන අවස්ථාවේ දී විදේශ විනිමය අගයන් ඉහළ යාම හේතුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

- වාහන හා යන්ත්‍ර අමතර කොටස් වල මිල ඉහළ යෑම සහ වාර සේවා ගාස්තු හා අළුත්වැඩියා සේවා ගාස්තු පෙර වර්ෂ වලට සාපේක්ෂව ඉහළ යාම සහ ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවට වඩා මෙම වර්ෂය තුළ නිල ප්‍රවාහන පහසුකම් සඳහා ප්‍රවාහන දීමනාව සඳහා හිමිකම් ලබන නිලධාරීන් සංඛ්‍යාව ඉහළ යාම හේතුවෙන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

- තැපැල්, දුරකථන හා අන්තර්ජාල පහසුකම් වලට අදාළ ගාස්තු ඉහළ යාම මත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

- පෙර වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර නොමැති වීම හේතුවෙන් ගෙවීමට නොහැකි වූ හිඟ වරිපනම් බදු මෙම වසර තුළ ගෙවීමට සිදුවීම.

- මෙම දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත් වාහන සංචිතයක් නොමැති වීම හේතුවෙන් මෙහෙයුම් කල්බදු ක්‍රමයට වාහන ප්‍රසම්පාදනය කර ගැනීමට සිදුවීම.

- ඇතැම් රාජ්‍ය ව්‍යවසායන්හි කාරක ප්‍රාග්ධන ගැටළු පියවා ගැනීම් සඳහාත් ඇතැම් රාජ්‍ය ව්‍යවසායන් වෙත පැවති අධිකරණ ක්‍රියාමාර්ග වල ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කිරීම

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 6 ක් සහ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් එම ප්‍රතිපාදන වර්ෂය තුල උපයෝජනය කළ පසු රු.50,125,840,726 ක ඉතිරියක් පැවති අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 48 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

පහත සඳහන් කරුණු හේතු වී ඇත.

- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 අනුව කාර්ය මණ්ඩලයේ නිලධාරීන් වැටුප් රහිත දේශීය හා විදේශීය නිවාඩු ලබා ගැනීම.

- අයවැය චක්‍රලේඛ අංක 02/2023 අනුව වියදම් පාලනය කිරීම.

- අයවැය චක්‍රලේඛ අංක 01/2023 අනුව පුනරාවර්තන ප්‍රතිපාදන සියයට හයකින් ඉතිරි කර තැබීම.

- එම -

| | | |
|---|---|---|
| | • ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ දේශීය ණය හා විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු වේ යැයි අපේක්ෂා කළ ද එය නියමිත පරිදි සිදු නොවීම.<br>• ලංකා විදුලිබල මණ්ඩලයේ ශේෂ පත්‍රය ප්‍රතිව්‍යුහගතකිරීම සඳහා රු. බිලියන 129 ද ප්‍රාග්ධන දායත්වයක් ලබා දීමට අපේක්ෂා කළ ද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ලැබීමට නියමිතව තිබූ ඩොලර් මිලියන 697 ක ණය මුදලෙහි රුපියල් අගය මත ලංකා විදුලිබල මණ්ඩලය වෙත අපේක්ෂිත මුළු ප්‍රාග්ධන දායකත්වය ලබා දීමට නොහැකිවීම.<br>• කොළඹ නෙළුම් කුළුණ කළමනාකරණ සමාගමේ වියදම් දැරීම සඳහා ආයතනය සතු මුදල් ප්‍රමාණය ප්‍රමාණවත් වූ බැවින් ප්‍රාග්ධන දායකත්වයක් ලබා දීමේ අවශ්‍යතාවයක් ඇති නොවීම.<br>• නෝර්ත් සී සමාගමෙහි ව්‍යවස්ථාපිත ගෙවීම් නිරවුල් කිරීමේ කටයුතු වෙනුවෙන් අධිකරණයෙහි සිදු කරමින් පවතින නඩු කටයුතු අවසන් නොවීම.<br>• ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගමට ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම. | |
| (ඇ) 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 2(ඇ) (iii) ඡේදය ප්‍රකාරව වැය විෂය 1003 - වෙනත් දීමනා සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන ද අවම වශයෙන් සියයට 06 කින් අඩුකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ එම වැය විෂය යටතේ වූ ඉතිරිය රු.1,106,269 ක් පමණක් වූ අතර, එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 4 ක් වී තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මූලික ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන්කර නොගත් වැය විෂයයන් 13 ක් වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් එකතුව රු.114,533,109,879 ක් වූ ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණ බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

## 2.3 බැඳීම් හා බැරකම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ.94(1) ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් සේවයක් හෝ සැපයුමක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා වූ මුදල් ප්‍රතිපාදන ඉක්මවා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳිය යුතු වුවද, වැය විෂයය 241-1-1-1402 යටතේ 2023 දෙසැම්බර් 31 දින වන විට ප්‍රතිපාදන ඉතිරිවීම් රු.64,590 ක් වී තිබූ නමුත්, එම ඉතිරිය ඉක්මවා රු.27,857 ක බැරකමකට බැඳී තිබුණි. | එකඟ වේ. ඉදිරියේ දී ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් වලට එළඹීම වැළැක්වීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2022/02 හි 10 ඡේදය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාවද ඉදිරිපත් කළ යුතු වුවද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2024 පෙබරවාරි 28 දින වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේදී වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ද ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | නෛතික විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 මැයි 22 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 1550/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 7 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන හෝ අලෙවි කරන සෑම මගී ප්‍රවේශ පත්‍රයක් සම්බන්ධයෙන්ම එවැනි ටිකට්පත් විකිණීමේ ආකාරය සහ හෝ නිකුත් කිරීම නොසලකා ඇ.ඩො. 60 ක අධිභාරයක් හෝ එම මුදලට සමාන මුදලක් අය කරනු ලැබිය යුතු බවත්, එම ගැසට් පත්‍රයේ 8 ඡේදය ප්‍රකාරව එලෙස එකතු කරගනු ලබන අධිභාර මුදල් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කළ හැකි පරිදි ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බවත් දක්වා ඇත. ඒ අනුව 2008 අගෝස්තු 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් අධිභාරය ලෙස රු.මිලියන 22,113 ක් එකතු කර ගෙන තිබුණ ද, එම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. තවද මේ සම්බන්ධයෙන් 2017 ජුනි 12 දින නීති කටයුතු දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ මතය "මෙම අධිභාරය තවදුරටත් අය කර ගැනීමට හැකියාව ඇති බවත්, එම අධිභාර මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමේ නීතිමය බැඳීමක් පවතින බවත්" ලෙස සඳහන් කර 2017 අප්‍රේල් 07 දිනැති නීතිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපිය ද සමඟ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර තිබුණි. එසේ වුවද, විගණිත දිනය වන විටත් මෙම අධිභාර මුදල සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් අයකර ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක CP/24/0226/628/015 වූ "ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ වියදම් සඳහා අරමුදල් සපයා ගැනීම" යන මැයෙන් වරාය ගුවන් සේවා හා නාවික ඇමතිතුමා ඉදිරිපත් කළ 2024.01.30 දිනැති සංදේශයට අදාළව 2023.12.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹි තීරණය අනුව මේ වන විටත් 2023 නොවැම්බර් මස සිට 2024 මාර්තු මස දක්වා විදේශීය විකුණුම් අධිභාර ආදායම වන රු.1,766,269,517 ක මුදලින් රු.393,000,000 ක මුදලක් රඳවා ගැනීමෙන් අනතුරුව රු.1,373,269,517 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට 2024.05.10 දින බැර කිරීමට කටයුතු කර ඇත. මෙම ආදායම සති දෙක බැගින් වූ කාර්තු දෙකකට ගුවන් සේවා ආයතනය වෙතින් අය කරනු ලබන අතර, දෙවන කාර්තුවේ මුදල් ලැබෙනුයේ ඊළඟට එළඹෙන මස 15 දිනයේ දී බවත්, ඒ අනුව ඉදිරි මාස වලට අදාළ ප්‍රේෂණයන් යම් මාසයක් අවසන්ව ඊළඟට එළඹෙන මාසයේ 20 වන දිනට පෙර එවීමට කටයුතු කරන බව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපති විසින් දැනුම් දී ඇත. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වන ආදායම් රැස් කිරීම් සම්බන්ධව විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

(ආ) ප්‍රාග්ධන දායකත්වය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2023 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ප්‍රාග්ධන දායකත්වය ලෙස රු.1,124,665,353,761 ක් සපයා තිබූ රාජ්‍ය ව්‍යවසායන් 13 ක 2022 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම රු.1,047,966,900,772 ක් වූ අතර, එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ඒවායේ ශුද්ධ වත්කම් (මුළු වත්කම් - මුළු බාහිර වගකීම්) වල අගය සෘන රු.630,632,144,273 ක් වී තිබුණි. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ මෙම ප්‍රාග්ධන දායකත්වයන් දක්වා ඇති නමුත්, එහි වටිනාකම පූර්ණ වශයෙන් අපහායනය (impairment) වී, අදාළ ආයතන මුළුමනින්ම බාහිර වගකීම් යටතේ පවත්වාගෙන යන තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂණය විය. තවද, මේ සඳහා මූලික වශයෙන් බලපා ඇත්තේ අදාළ ආයතන අලාභ ලැබීම හේතුවෙන් රඳවා ගත් ලාභය සෘන අගයක් ගැනීම බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | රාජ්‍ය ව්‍යවසායන්හි දිගුකාලීන ණය ඇතුළු බාහිර වගකීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7 ක් පමණ වේ. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ රාජ්‍ය ව්‍යවසායන්හි පිරිවැය පිළිබිඹු මිල ක්‍රමයක් නොමැති වීමත් වෙළඳපළ මිල වෙනුවට සහනදායි මිලකට භාණ්ඩ සැපයීමේදී එකී පිරිවැය සෘජු රාජ්‍ය මූල්‍ය ප්‍රදාන හරහා මූල්‍යනය නොකිරීමත් හේතුවෙන් දිගින් දිගටම රාජ්‍ය ව්‍යවසායන් විසින් අලාභදායී තත්ත්වයන් වාර්තා කිරීමත්, එකී අලාභයන් රාජ්‍ය බැංකු හරහා මූල්‍යනය කිරීමත්ය. මේ අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් වැනි උපායමාර්ගික වශයෙන් වැදගත් රාජ්‍ය ව්‍යවසායන් විසින් දිගින් දිගටම වාර්තා කල අලාභ තත්ත්වයන් රාජ්‍ය බැංකු හරහා මූල්‍යනය කිරීම පසුගිය වර්ෂවල කැපී පෙනෙන ප්‍රවණතාවයක් විය.<br>මීට අමතරව රජයේ ප්‍රතිපත්තිමය තීරණ වල බලපෑම ද ඉහත තත්ත්වයන් ඇති වීම සඳහා හේතු විය. | රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතනයන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර ඒවායේ වටිනාකම්හි අඩුවීම් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිසි පරිදි අන්තර්ගත කළ යුතු වීම. |
| (ii) | 2023 දෙසැම්බර් 31 දිනට රු.1,019,627,985,708 වන සහ 2022 දෙසැම්බර් 31 දිනට රු.892,034,785,542 ක් වූ රජයේ ප්‍රාග්ධන වටිනාකමක් සහිත රාජ්‍ය ව්‍යවසායන් 05 ක 2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම්වල වටිනාකම | -එම- | රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතනයන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීමට හා ඒවායේ වටිනාකම්හි අඩුවීම් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ |

| | | | |
|---|---|---|---|
| | රු.371,771,137,033 ක් පමණක් විය. ඒ අනුව මෙම රාජ්‍ය ව්‍යවසායන් වල ආයෝජනය කර ඇති ප්‍රාග්ධන දායකත්ව වටිනාකම අපහායනයට (impairment) ලක් වෙමින් පවතින බව නිරීක්ෂණය විය. | | නිසි පරිදි අනාවරණය කළ යුතු වීම. |
| (iii) | 2022 දෙසැම්බර් 31 දිනට පැවති රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ව්‍යවසායන් සඳහා ප්‍රාග්ධන දායකත්ව වටිනාකම රු.2,165,981,657,905 ක් වූ අතර, එයින් රු.2,121,653,720,125 ක් රජයේ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල ආයෝජනය කර තිබුණි. සමස්තයක් ලෙස ගත් කළ රජය සතු මෙම ව්‍යාපාර ආයතනවල ශුද්ධ වත්කම්වල මුළු වටිනාකම 2022 දෙසැම්බර් 31 දින වන විට රු.1,669,676,388,290 ක් වී තිබුණි. ඒ අනුව, ඉහත වර්ග තුනට අදාළ රජයේ ප්‍රාග්ධන දායකත්වය එම ආයතනවල ශුද්ධ වත්කම්වලට සාපේක්ෂව සියයට 21 කින් හෙවත් රු.451,977,331,835 කින් අපහායනය වී ඇති බව නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (iv) | 2022 වර්ෂය තුළදී රජය විසින් ආයෝජනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩල 32 කට අදාළව රු.117,718,706,426 ක ශුද්ධ ලාභයක් උපයා තිබුණ ද, රාජ්‍ය සංස්ථා 36 කට සහ රජය සතු සමාගම් 30 කට අදාළව පිළිවෙලින් රු.804,795,113,607 ක් හා රු.133,722,486,417 ක් ලෙස එකතුව රු.938,517,600,024 ක ශුද්ධ අලාභ ඉපයීම හේතුවෙන් මෙම ආයතන 98 ට අදාළව සමස්තයක් වශයෙන් රු.820,798,893,548 ශුද්ධ අලාභයක් උපයා ඇති බව නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව 2022 වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය 22,181,000 වූ අතර, ඒ අනුව රජය සතු ව්‍යාපාර ආයතන 98 ක් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා දරා ඇති ඒක පුද්ගල ශුද්ධ අලාභය රු.37,000 ක් පමණ වන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (v) | 2022 වර්ෂය අවසානය වන විට රාජ්‍ය ව්‍යසායන් 17 කට අදාළව ජංගම අනුපාතය දුර්වල තත්වයක පැවතුණි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ගුවන් සමාගමේ ජංගම අනුපාතය 0.15 ක් වැනි ඉතාමත් පහළ අගයක පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම රාජ්‍ය ව්‍යවසායන් ද්‍රවශීලතා දුෂ්කරතාවයන්ට මුහුණ දීමේ ඉහළ අවධානමක් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | මහා භාණ්ඩාගාරය සතුව රාජ්‍ය ව්‍යවසායන්හි ආයෝජන සිදු කිරීම සඳහා පවතින මූල්‍ය ශක්‍යතාවය ඉතාමත් සීමාකාරී වේ. එවැනි අවස්ථා වලදී රාජ්‍ය ව්‍යවසායන් වෙත සිය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට බැංකු මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීමට සිදු විය. ඒ අනුව, බැංකු වෙත පියවිය යුතු ණය වාරික හා පොළිය ඉහළ යාම මත ජංගම වගකීම් ද ජංගම වත්කම් වලට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා ලදී. එමඟින්, අදාළ රාජ්‍ය ව්‍යවසායන්හි කෙටි කාලීන වගකීම් පියවීම සඳහා ද්‍රවශීල වත්කම් ප්‍රමාණවත් නොවන මට්ටමක පවතී. කෙසේ වෙතත් ශ්‍රී ලංකන් ගුවන් සමාගම වෙත එහි වගකීම් තවදුරටත් ගෙවා ගත නොහැකි බව නිරීක්ෂණය වන බැවින්, විභව ආයෝජකයන්ට ආකර්ෂණය වීම පිණිස ඇ.එ.ජ. ඩොලර් මිලියන 210 ක් සහ ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක් වූ වගකීම් රජයට පවරා ගැනීම තුළින් එහි ශේෂ පත්‍රය ප්‍රතිව්‍යුහගත කරන ලදී. | -එම- |
| (vi) | 2022 වර්ෂය අවසානය වන විට රාජ්‍ය ව්‍යවසායන් 16 ක් සම්බන්ධයෙන් අධි ප්‍රාග්ධන තෝලන තත්ත්වයක් නිරීක්ෂණය විය. මෙහි ඇතැම් ආයතනවල රජයේ ප්‍රාග්ධනයට වඩා ගෙවිමට ඇති දිගුකාලීන ණය ඉහළ අගයක් ගෙන තිබුණි. තවද රජයේ ප්‍රාග්ධන දායකත්වය ඍන අගයක් ගෙන ඇති රාජ්‍ය ව්‍යවසායන්ද නිරීක්ෂණය වූ අතර එම ආයතන මුළුමනින්ම දිගුකාලින ණය මඟින් මූල්‍යනය කර තිබුණි. ඒ අනුව මෙම සියලු ආයතන ඉහළ මූල්‍ය අවධානමකට (Financial Risk) මෙන්ම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානමකට මුහුණ දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. | මෙම රාජ්‍ය ව්‍යවසායන් සිය මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය බැංකු මඟින් ලබා ගන්නා ලද දිගු කාලීන ණය මඟින් මූල්‍යනය කිරීම හේතුවෙන් අධිතෝලන තත්ත්වයන්ට මුහුණපා ඇත. ඇතැම් රාජ්‍ය ව්‍යවසායන්ට බැංකු ණය නියමිත කාල සීමාව තුළ සේවාකරණය කිරීමටද අපොහොසත්වීම තුළ ණය හිමියන්ගේ එකඟතාවයෙන් ණය ප්‍රතිව්‍යුහගත කිරීමට පවා සිදු වී ඇත. රජය සතු සීමාකාරී මූල්‍ය අවකාශය හමුවේ රාජ්‍ය ව්‍යවසායන්හි | -එම- |

| | | | |
|---|---|---|---|
| | | පවතින ප්‍රාග්ධන දූෂ්කරතා සඳහා මූල්‍යමය සහනයන් ලබා දීම අපහසු වුවද 2023 වර්ෂයේදී ගනු ලැබූ ප්‍රතිසංස්කරණයන් තුළින් ව්‍යවසායන්හි පැවති අධිතෝලනය යහපත් තත්ත්වයකට ගෙන ඒමට හැකිවිය. | |
| (vii) | රාජ්‍ය ව්‍යවසායන් 8 ක් විසින් ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 10,803 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 4,323 ක් වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 6,480 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ සෘජු ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය අතර පවතින මෙම වෙනස්කම් අප වෙත ද නිරීක්ෂණය වූ අතර එම වෙනස ඇතිවීමට බලපෑ හේතු කවරේද යන්න හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර අදාළ වෙනස්කම් නිසි පරිදි හඳුනා ගැනීමෙන් අනතුරුව විධිමත් අනුමැතියක් සහිතව ප්‍රධාන ලෙජර ගිණුම්වල වාර්තා කිරීමට අපේක්ෂා කෙරේ. | රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ඇගයීමට ලක් කර නිසි ක්‍රියා මාර්ග ගැනීමට හා ගිණුම් වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (viii) | රාජ්‍ය ව්‍යවසායන් 9 ක් විසින් ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 994,992 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 995,171 ක් වීම හේතුවෙන් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 179 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ix) | 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ සෘජු ශේෂ සනාථකිරීම් සහ රජයේ මූල්‍ය ප්‍රකාශන අතර ආයතන 09 කට අදාළව රජයට අයත් කොටස් සංඛ්‍යාවෙහි වෙනස්කම් නිරීක්ෂණය විය. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 135 ක් අඩුවෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර තිබුණි. | මෙහි සඳහන් සමාගම් මගින් කොටස් නිකුත් කිරීමට අදාළව කොටස් සහතික පත්‍ර මේ වන තෙක් අප වෙත ලැබී නොමැති අතර ඒවා ලද විගස අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (x) | Sri Lanka Institute of Biotechnology (Pvt) Ltd ආයතනයෙන් ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට කොටසක මිල රු.10 ක් වූ කොටස් 52,472,573 ක් මහා භාණ්ඩාගාරය සතු බව සඳහන් කර තිබුණ ද, රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් වී ඇත්තේ කොටසක මිල රු.100 ක් වූ කොටස් 200,000 ක ප්‍රාග්ධන දායකත්වයක් පවතින බවයි. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයේ ප්‍රාග්ධන දායකත්වය රජයේ මූල්‍ය ප්‍රකාශනයේ රු.504,725,732 ක් අඩුවෙන් සටහන් වී තිබුණි. | Sri Lanka Institute of Biotechnology (Pvt) Ltd වෙත අදාළ රේඛීය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙහි හිමිකම් ප්‍රාග්ධන වැය විෂය යටතේ ලබා දී ඇති ප්‍රාග්ධන දායකත්වය ප්‍රධාන ලෙජර ගිණුම්වල වාර්තා නොවීම මත මෙම වෙනස හට ගෙන ඇති අතර මෙම වර්ෂය තුළදී අදාළ වාර්තා කිරීමේ කටයුතු සිදු කෙරෙනු ඇත. | -එම- |
| (xi) | රාජ්‍ය සමාගම් 02ක හිමිකාරීත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නාමික අගය අනුව ගණනය කිරීමේදී 2023 දෙසැම්බර් 31 දිනට කොටස් වටිනාකම රු.මිලියන 5,141 ක් වුවද, එය රජයේ මුල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 14,476 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන වල කොටස් වටිනාකම රු.මිලියන 9,335 ක් වැඩියෙන් ප්‍රාග්ධන දායකත්වය දක්වා තිබුණි. | Bogala Graphite Lanka PLC හි කොටස් ප්‍රාග්ධනය ගණනය කිරීමේදී අතපසුවීමක් සිදු වී ඇති බව නිරීක්ෂණය කරමි. අදාළ ගණනය කිරීම් නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි.<br><br>මිහින් ලංකා (පෞද්ගලික) සමාගම වෙත 2021 සහ 2022 වර්ෂවලදී සිදු කරන ලද ප්‍රාග්ධන දායකත්වය අදාළ ප්‍රධාන ලෙජර් ගිණුම්හි සටහන් කළ ද ඒ සඳහා කොටස් සහතික නිකුත් කිරීමක් සිදු වී නොමැත. කෙසේනමුත්, අදාළ ආයතනය වෙත හිමිකම් ප්‍රාග්ධනය ලෙස ලබා දුන් මුදල් අදාළ ප්‍රධාන ලෙජර් ගිණුම්හි වාර්තා කොට ඇත. | -එම- |
| (xii) | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 241,651 ක් වූ අතර, ඉන් රු.මිලියන 34,090 ක් එනම් සියයට 14 ක එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ එනම් ණය සහ ණය පොලී ගෙවීම් සහ වැටුප් හා වේතන ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල්වලින් සමන්විත විය. | මෙම ආයතන සියල්ලෙහිම සම්පූර්ණ අයිතිය මහා භාණ්ඩාගාරය සතු වේ. ඒ අනුව එම ආයතනවල පවතින කාරක ප්‍රාග්ධන ගැටළු හෝ අනෙකුත් පුනරාවර්තන ස්වරූපයේ වියදම් සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය මහා භාණ්ඩාගාරය විසින් ලබා දිය යුතු වේ. | පුනරාවර්තන ස්වරූපයේ වියදම් දැරීම තුළින් ආයතනවල ප්‍රාග්ධන දායකත්වයන් වැඩිවීමක් සිදු නොවන බැවින් නිසි ක්‍රමවේදයක් ඒ සඳහා අනුගමනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (xiii) | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ව්‍යවසායන් 05 ක් සඳහා රු.මිලියන 176 ක ප්‍රාග්ධන දායකත්වයක් සිදුකර තිබුණ ද, ඒ වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට හිමි කොටස් සංඛ්‍යාවෙහි වෙනසක් සිදු වී නොතිබුණි. | රාජ්‍ය සමාගම්හි සිදු කරනු ලබන ප්‍රාග්ධන දායකත්වය ප්‍රධාන ලෙජර් ගිණුම්හි වාර්තා කිරීම සඳහා පෙර පැවති ක්‍රමවේදය වූයේ අදාළ සමාගම විසින් කොටස් සහතිකය නිකුත් සමාගම් විසින් කොටස් සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා සැළකිය යුතු කාලයක් ගත වන බැවින් කොටස් සහතික නිකුත් වන තුරු නොසිට අදාළ ප්‍රාග්ධන දායකත්වය සිදු කළ වහාම ගිණුම්ගත කිරීමේ කටයුතු සිදු වේ. | රජය මඟින් සිදුකරන ලද කොටස්වල ආයෝජනයට අදාළ සහතික කඩිනමින් ලබාගැනීමට කටයුතු කල යුතු වීම. |
| (xiv) | මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ඇවර කිරීම සම්බන්ධව අංක MOF/DG/LAD/CO/142/2017 හා 2017 ඔක්තෝබර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි යෝජනා අංක (අ), (ආ), හා (ඇ) සඳහා අංක අමප/17/2383/733/026-1 හා 2017 නොවැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර ලේකම් විසින් සමාගම ඇවර කිරීම සඳහා විශේෂ යෝජනාවක් සම්මත කර වාණිජ මහාධිරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව අධිකරණය විසින් 2018 මාර්තු 18 දින ඇවරකරුවකු පත් කර තිබුණු තත්ත්වයකදී මහජන බැංකුවෙන්, එම ආයතනය ලබාගත් ණය වාරිකය හා පොළිය ගෙවීම සඳහා 2021 හා 2022 වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 272 ක් හා රු.මිලියන 441 ක් වශයෙන් එකතුව රු.මිලියන 713 ක් එම සමාගම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී මහා භාණ්ඩාගාරය වෙතින් ලබා දී තිබුණි. | මිහින් ලංකා (පෞද්ගලික) සමාගම වෙත 2021 වර්ෂය සඳහා ලබා දී තිබූ ප්‍රාග්ධන දායකත්වය එම වර්ෂවලදී අදාළ ප්‍රධාන ලෙජර් ගිණුමෙහි වාර්තා වී නොතිබුණි. ප්‍රාග්ධන දායකත්වය සිදු කළ වර්ෂයේදීම කොටස් සහතික පත්‍ර නිකුත් නොවන අවස්ථාවන්ද පවතින බැවින් අදාළ ගිණුම්ගත කිරීමේ කටයුතු ද ප්‍රමාද වීම සිදු වේ. එබැවින් එවැනි අතපසුවීම් වළක්වා ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට කොටස් සහතික අදාළ සටහනේ ප්‍රධාන ලෙජර් ගිණුම් තුළ ද ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. | අරමුදල් ලබා දීමේදී රජයට විය හැකි අවාසිසහගත තත්ත්වයන් අවමවන පරිදිත්, පවතින තත්ත්වයන් විධිමත්ව ඇගයීමකින් යුතුවත් සිදුකළ යුතුවීම. |
| (xv) | සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් සටහන් 15 යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ආයෝජනය කරන ලද කොටස් ගණන සටහන් කර නොතිබුණු අතර වටිනාකම රු.1,271,480,516 ක් ලෙස | මේ වන තෙක් මෙම කොටස් ආයෝජනය සම්බන්ධයෙන් කොටස් සහතිකපත් ලැබී නොමැත. අතපසුවීමකින් අදාළ කොටස් වටිනාකම සටහන් වී නොමැති අතර, | රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ගිණුම් වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු |

| | | | |
|---|---|---|---|
| | සටහන් කර තිබුණි. තවද, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් ලද ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය සතු ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ කොටස් හිමිකාරීත්වය සියයට 50.23 ක් වුවද රජයේ මූල්‍ය ප්‍රකාශනයෙහි එය සියයට 49.5 ක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී එම වටිනාකම ද ඇතුළත් කිරීමට කටයුතු කරමි. අදාළ ප්‍රතිශතය ගණනය කිරීමේදී සිදු වූ ගණිත දෝෂයක් හේතුවෙන් මෙම වෙනස ඇති වූ අතර එය ඉදිරියේදී නිවැරදි කර ගැනීම සඳහා සටහන් කර ගතිමි. | වීම. |
| (xvi) | රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 269,386 ක් වූ අතර, ඉන් රු.මිලියන 228,771 හෙවත් සියයට 85 ක් 2023 සැප්තැම්බර් 26 දිනැති අමප 23/1812/604/118-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සහ සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙහි ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ කරන ලද ස්කන්ධ ආයෝජනයන් හේතුවෙන් වැඩි වී තිබුණි. | එකඟ වේ. සටහන් කර ගතිමි. | රජය සතු ව්‍යවසායන්හි හඳුනාගත් වගකීම් රජයට පවරා ගැනීම හේතුවෙන් රජය මූල්‍ය අර්බුදයකට බලපෑ හැකි බැවින් එම වගකීම් නිරවුල් කිරීමට නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු වීම. |
| (ඇ) | "මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම" යන ප්‍රධාන කාර්යය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ආයතන වල වාර්ෂික වාර්තා නියමිත දිනවල පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් විය. මේ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය වේ. | | |
| (i) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන ආයතන 305 ක් පැවතිය ද, 2024 මැයි 25 දින වන විට පාර්ලිමේන්තු නිල වෙබ් අඩවිය අනුව දෙපාර්තමේන්තුව ක්‍රමෝපායිකව වැදගත් ලෙස සලකන ලද ආයතන 52 අතුරින් ආයතන 33 ක පමණක් 2022 වර්ෂයට අදාළව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි. | 2023 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු සභාගත කිරීම පිළිබඳව මෙම වර්ෂය ආරම්භයේ දී අදාල ආයතන වල ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්, ආයතන ප්‍රධානීන් හා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම සිදු කර ඇත. මේ පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාල ආයතන වෙත විටින් විට දැනුවත් කිරීම් සිදු කර ඇත. | අධීක්ෂණයට ලක්වන සියලුම ආයතන සම්බන්ධයෙන් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ තොරතුරු පසුවිපරම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2023 වර්ෂය වෙනුවෙන් 2024 මැයි 25 දින වන විට එකී රාජ්‍ය ව්‍යවසායන් 52 න් කිසිදු ආයතනයක වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | -එම- | අධීක්ෂණයට ලක්වන සියලුම ආයතන සම්බන්ධයෙන් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ තොරතුරු පසුවිපරම් කළ යුතු වීම. |
| (iii) | 2021 වර්ෂයේදී හඳුන්වා දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 පරිච්ඡේදය පරිදි වාර්ෂික කාර්යය සාධන ඇගයීම් රැස්වීමේ දී වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ද ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ද ඉතා පහල මට්ටමක පැවතුන බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් අදාළ දැනුවත් කිරීම් නිරන්තරයෙන් මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී. එහෙත් වාර්ෂික කාර්යසාධන ඇගයීම් රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් අදාල ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දැරිය යුතුය. | ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

**4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති තනතුරු පුරප්පාඩු 06 ක් අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ තනතුරු 04 ක්, තෘතියික මට්ටමේ තනතුරු 01 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක් පුරප්පාඩුව පැවතුණි. | 2023 දෙසැම්බර් 31 වන දිනට පැවති ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 අතරින් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු 02ක් සඳහා දැනට නිලධාරීන් දෙදෙනෙක් අනුයුක්ත වී ඇති අතර, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පිරවීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. තවද, දෙපාර්තමේන්තු ගත සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා නියමිත ක්‍රමවේදයට අනුව සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීමට දැනට කටයුතු කෙරෙමින් පවතී.<br><br>එසේම තෘතියික මට්ටමේ පුරප්පාඩුව පවතින තනතුර දෙපාර්තමේන්තුගත තනතුරක් වන මූල්‍ය විශ්ලේෂක | අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම හා අත්‍යාවශ්‍ය නොවන කාර්ය මණ්ඩලයක් අනුමත කාර්ය මණ්ඩලය තුළ වේ නම් අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | තනතුරක් වන අතර, ඒ සඳහා සේවය හැර යාමේ නියෝග නිකුත් කිරීම මත අදාළ තනතුර පුරප්පාඩු වී ඇත. ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු වීම සහ ඒ වෙනුවට අනුප්‍රාප්තිකයන් නොපැමිණීම මත අදාළ පුරප්පාඩුව ඇති වී ඇති අතර, ඉදිරියේදී ඒ සඳහා සුදුසු නිලධාරීන් අනුයුක්ත කරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) ද්විතියික මට්ටමේ තනතුරු 05 ක් අතිරික්තව පවතින අතර එය සංවර්ධන නිලධාරි තනතුරු 04 කින් සහ ගිණුම් සහකාර තනතුරු 01 කින් ද සමන්විත වී තිබුණි. | 2023.12.31 දිනට සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් 07 දෙනෙකු විධිමත් අනුමැතිය මත දේශීය සහ විදේශීය නිවාඩු ලබා ගැනීම නිසා දෙපාර්තමේන්තුවේ කටයුතු බාධාවකින් තොරව කඩිනමින් සිදුකිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් මෙම තත්ත්වය පැන නැගී ඇත.<br><br>තවද, පෙර පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අහෝසි වීම මත එහි සේවය කළ ගිණුම් සහකාර නිලධාරිණියක මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත වි ඇත. ඒ අනුව අදාළ තනතුර අනුමත කරවා ගැනීම සඳහා මේ වන විටත් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත විධිමත් පරිදි ඉල්ලීමක් සිදු කර ඇත. | -එම- |